## ප්‍රශස්ත තෙතමනයක් පවත්වා ගැනීම

- තෙතමනය වියලි බරෙන් 25% කට වඩා නොතිබීමට වග බලාගන්න
- කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමට ගන්නා අමුද්‍රව්‍ය වල තෙතමනය අනුව ජලය යෙදීම සිදු කරන්න
- සතියකට වරක් ගොඩ තුලට උල්කරගත් ලීයක් ඇතුල් කර එහි කෙලවර අත ගා තෙතමනය අනුව ජලය යෙදීම පිළිබඳව අවබෝධයක් ලබා ගන්න
- තෙතමනය අඩු නම් අවශ්‍ය පමණ ජලය යොදන්න
- තෙතමනය වැඩි නම් ලීයකින් ගොඩේ සිදුරු කීපයක් සාදා වියලි දිනයක ගොඩ වාතයට නිරාවරණය කර තබන්න
- ගොඩ කළු පොලිතීන් හෝ පොලිසැක් බෑග් හෝ වියාගත් පොල් අතු මඟින් වසා තබන්න
- නිපදවා ගත් කොම්පෝස්ට් මිටක් අතට ගෙන මිරිකිමෙන් ඇඟිලි අතරින් ජලය පිට නොවී පහසුවෙන් කැඩෙන ගුලියක් නිර්මාණය වන්නේ නම්, ප්‍රශස්ථ තෙතමනයක් ඇති බව වටහා ගත හැකිය.



## හොඳින් දිරාපත් කර ගැනීම

- හොඳින් වාතාශ්‍රය ලැබීමට සැලැස්වීමෙන් අමුද්‍රව්‍ය හොඳින් දිරාපත් වේ
- ගොඩ නිපදවීමේදී සත්ව පොහොර හා ශාක කොටස් නිසි පරිදි මාරුවෙන් මාරුවට තට්ටු ලෙස තැන්පත් කරන්න
- සත්ව පොහොර තට්ටුවක උස උපරිම ලෙස අඟල් 8-9 ක් පමණ පවත්වා ගන්න
- ගොඩ නිපදවීමේදී ගොඩ තද නොකර හොඳින් වාතාශ්‍රයක් ලැබෙන සේ ගොඩ සකස් කරන්න
- ප්‍රශස්ථ තෙතමනයක් පවත්වා ගැනීමෙන් හොඳින් වාතාශ්‍රයද ලැබෙනු ඇත
- හොඳින් වාතාශ්‍රය ලබාදීමෙන් භාවිතා කල අමුද්‍රව්‍ය ඉක්මණින් දිරාපත් වන අතර නිෂ්පාදනය කළ කොම්පෝස්ට්හි නොදිරූ අමුද්‍රව්‍ය කොටස් අන්තර්ගත නොවේ

## හොඳ කළු පැහැයක් ලබාගැනීම

- හැකි සෑම අවස්ථාවකම ගොම, එළු පොහොර යනාදී සත්ව පොහොර භාවිතා කරන්න
- කොළ පැහැති කොළ වර්ග භාවිතා කරන්න
- ලී කුඩු, කොහුබත් වැනි අමුද්‍රව්‍ය වෙනත් අමුද්‍රව්‍ය සමඟ සැසඳීමේදී අඩු ප්‍රමාණයක් භාවිතා කරන්න

## අංශු ප්‍රමාණය

වාණිජ මට්ටමේදී ඒකාකාරී සංයුතියකින් යුතු කොම්පෝස්ට් ලබා ගැනීමට මි.මී. 4 (Mesh No 4) දැලකින් නිපදවා ගත් කොම්පෝස්ට් හලා ගන්න

2015

**සැකසුම:**
ආචාර්ය ජේ.ඩී. හේමන්ත විජේවර්ධන,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)
ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය,
මාකඳුර, ගෝනවිල (වයඹ)
දුරකථන අංක: 031-2299625
031-2299805
ෆැක්ස්: 031-2299707
ඊ මේල්: Wijehema@yahoo.com

*කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයේ කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය දිරි ගැන්වීමේ වැඩසටහන අනුග්‍රහයෙනි.*

"අපි වවමු - රට නඟමු"

**කොම්පෝස්ට් නිෂ්පාදනය - 6**

# තත්ත්වයෙන් උසස් කොම්පෝස්ට් නිපදවා ගන්නා ආකාරය




**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.**

Designed by: AUDIO VISUAL CENTRE, Department of Agriculture, Peradeniya.
Printed by: AGRICULTURE PRESS, Gannoruwa.

කොම්පෝස්ට් නිෂ්පාදනයේදී තත්ත්වයෙන් උසස් කොම්පෝස්ට් නිපදවා ගැනීම ඉතා වැදගත්ය. නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට්හි තත්ත්වය උසස් ලෙස තබා ගැනීමට පිළිපැදිය යුතු උපදෙස් කීපයකි. එම උපදෙස් පිළිපැදීමෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් කොම්පෝස්ට් සඳහා ලබාදී ඇති සම්මත තත්ත්ව සහිත කොම්පෝස්ට් නිපදවා ගැනීමට අවස්ථාවක් ලැබෙනු ඇත.

### භාවිතා කලයුතු අමුද්‍රව්‍ය

තත්ත්වයෙන් උසස් කොම්පෝස්ට් ලබා ගැනීමට පහත සඳහන් අමුද්‍රව්‍ය දෙවර්ගයම භාවිතා කළ යුතුය.

- ශාක කොළ වර්ග
- සත්ව අපද්‍රව්‍ය

### යෝග්‍ය ශාක කොටස්

- නයිට්‍රජන් වැඩිපුර අන්තර්ගත කොළ වර්ග
- කොළ පැහැති කොළ වර්ග

### දිරාපත්වීමට අපහසු ශාක කොටස් භාවිතයේදී පිළිපැදිය යුතු උපදෙස්

- වියළි කොළ භාවිතයේදී අමු කොළ සමඟ මිශ්‍ර කර හෝ තට්ටු ලෙස මාරුවෙන් මාරුවට අමු කොළ හා වියලි කොළ ස්ථර තැන්පත් කරන්න
- දිරාපත්වීමට අපහසු අමුද්‍රව්‍ය අර්ධ ලෙස දිරාපත් කර කොම්පෝස්ට් නිපදවීමට භාවිතා කරන්න
- දිරීමට අපහසු ශාක කොටස් තට්ටු අතරට දිරාපත් වීමට පහසු සත්ව පොහොර යොදන්න

### සත්ව අපද්‍රව්‍ය භාවිතා කිරීමේදී සැලකිය යුතු කරුණු

- ඉක්මණින් දිරාපත්වන සත්ව පොහොර භාවිතා කරන්න
- හැකි පමණ අළුත් සත්ව පොහොර භාවිතා කරන්න
- හැකි සෑම අවස්ථාවකම සත්ව මූත්‍රා කොම්පෝස්ට් ගොඩට එක් කරන්න
- සත්ව පොහොර තට්ටුවක උස අඟල් 8-9 කට වඩා වැඩි නොකරන්න

### කොම්පෝස්ට් වල අඩංගු පෝෂ්‍ය පදාර්ථ ප්‍රමාණය වැඩි කිරීම

#### නයිට්‍රජන් ප්‍රමාණය වැඩි කිරීම

නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් වල අන්තර්ගත නයිට්‍රජන් ප්‍රමාණය වැඩි කිරීමට භාවිතා කල යුතු අමුද්‍රව්‍ය වර්ග

- රනිල කුලයේ ශාක කොල
- ළපටි කොළ හා කොළ පැහැති කොළ
- සත්ව පොහොර (උදා: ලේයර් කුකුල් පොහොර)

#### පොස්පරස් ප්‍රමාණය වැඩි කිරීම

නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට්වල අන්තර්ගත පොස්පරස් ප්‍රමාණය වැඩි කිරීමට එප්පාවල රොක් පොස්පේට් යෙදිය හැකිය

- රොක් පොස්පේට් කොම්පෝස්ට් නිපදවීමේදී තට්ටු 3-4 කට වරක් ඉසින්න
- අමුද්‍රව්‍ය කි.ග්‍රෑම් 1000 කට රොක් පොස්පේට් කි.ග්‍රෑම් 50 ක් පමණ යොදන්න
- කොම්පෝස්ට් නිෂ්පාදනයේදී රොක් පොස්පේට්හි ද්‍රාව්‍යතාවය ද වැඩි වේ

#### පොටෑසියම් ප්‍රමාණය වැඩි කිරීම

නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට්වල අන්තර්ගත පොටෑසියම් ප්‍රමාණය වැඩි කිරීමට කොම්පෝස්ට් නිෂ්පාදනයේදී අමුද්‍රව්‍ය ලෙස පහත සඳහන් දෑ භාවිතා කරන්න

- පිදුරු
- වල් සූරියකාන්ත කොළ
- සත්ව පොහොර
- අළු (කොම්පෝස්ට් නිෂ්පාදනය අවසන් වූ පසු පමණක් අළු මිශ්‍ර කරන්න)

### ද්විතික හා අංශුමාත්‍ර මූලද්‍රව්‍ය ලබාදීම

නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට්වල අන්තර්ගත ද්විතික හා අංශුමාත්‍ර මූලද්‍රව්‍ය වැඩි කිරීම සඳහා සෑම අවස්ථාවකදීම සත්ව පොහොර අමුද්‍රව්‍යයක් ලෙස භාවිතා කරන්න

### කොම්පෝස්ට්වල අන්තර්ගත වැලි ප්‍රමාණය අවම කර ගැනීම

- වැලි 10% කට වඩා අන්තර්ගත නොවීමට වග බලා ගන්න
- අමුද්‍රව්‍ය වැලි සමඟ මිශ්‍ර වී ඇත්නම් කොම්පෝස්ට් නිෂ්පාදනයට ප්‍රථම ඒවා දැලකින් හලා වැලි වෙන්කර කොම්පෝස්ට් නිෂ්පාදනයට භාවිතා කරන්න
- නිෂ්පාදනය කරනු ලබන ස්ථානයේ පස හොඳින් තලා සකස් කර ගන්න
- පෙරලීමේදී වැලි මිශ්‍ර වීම අවම වනසේ ප්‍රවේශමෙන් පෙරලීම සිදු කරන්න